## පළමුවන දේව ප්‍රකාශන

නික්මයාම 22:21-27

නික්මයාම පොතෙන් ගත් පාඨයෙකි.

**"කනවැන්දුම් ස්ත්‍රියකට වත් අනාථ දරුවෙකුට වත් හිරිහැර කරන විට ස්වාමීන් වහන්සේ උදහස් වන සේක."**

"නුඹලා විදේශිකයෙකුට අයුත්තක් වත් හිරිහැරයක් වත් නොකළ යුතු ය. මන්ද, නුඹලා මිසර දේශයෙහි විදේශිකයන් ව සිටි හෙයිනි. නුඹලා කණවැන්දුම් ස්ත්‍රියකට වත්, අනාථ දරුවෙකුට වත් හිරිහැර නොකළ යුතු ය. නුඹලා ඔවුන්ට හිරිහැර කොට ඔවුන් මට මොරගැසුවොත් මම සැබැවින් ම ඔවුන්ගේ මොරගැසීමට සවන් දෙමි. එවිට මගේ උදහස ඇවිළී, මම කඩුවෙන් නුඹලා නසන්නෙමි. නුඹලාගේ භාර්යාවෝ කණවැන්දුම් ස්ත්‍රීහු ද, නුඹලාගේ දරුවෝ අනාථ දරුවෝ ද වන්නෝ ය.

"නුඹලා මගේ සෙනග අතර සිටින දිළින්දෙකුට මුදල් ණයට දුන්නොත්, පොළියට මුදල් දෙන අය මෙන් නොහැසිරිය යුතු ය. නුඹලා බලයෙන් පොළියක් ද නොගත යුතු ය. නුඹ උගසක් මෙන් යමෙකුගේ වස්ත්‍රය ගන්නෙහි නම් ඉර බැස යාමට පෙර එය ඔහුට ආපසු දිය යුතු ය. මන්ද, ඔහුට ඇත්තේ ඒ පොරෝණය පමණක් බැවිනි. ඔහු තමාගේ ඇඟට පොරොවාගන්නේ ඒ වස්ත්‍රය වේ. නැත්නම් ඔහුට නිදාගන්න ඇත්තේ කුමක් ද? ඔහු මට මොරගසන විට මා අනුකම්පා සහගත බැවින් ඔහුට සවන් දෙමි."

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## පිළිතුරු ගීය

ගීතාවලිය 18:1-3, 46,50

**පිළිතුර : අපගේ සවි ශක්තිය වන සමිඳුනි, අපි ඔබ වහන්සේට ප්‍රේම කරමු.**

**ගීය :** මාගේ සවි ශක්තිය වන සමිඳුනි, මම ඔබට ප්‍රේම කරමි.
සමිඳාණෝ මාගේ පර්වතය ය. බලකොටුව ය, මිදුම්කාරයාණෝ ය.
ඔබ මා දෙවිඳාණෝ ය. පර්වත රැජිඳුණෝ ය. මම ඔබ සරණකොට ගනිමි.

ඔබ මට පලිහ ය, ගැළවීමේ බලය ය, උස් කොටු පවුර ය.
සියලු පැසසුම්වලට හිමිකම් ඇති සමිඳුනි, මම ඔබට අයැද සිටිමි.
මෙසේ මාගේ සතුරන්ගෙන් මම ගැළවෙන්නෙමි.

සමිඳාණෝ සැරදේවා ! මාගේ ප්‍රාකාරය වන එතුමන්ට පැසසුම් වේවා !
මාගේ විමුක්තිදායකයාණෝ අන් හැමට පරමෝත්තම වන සේක.
එතුමාණෝ සිය රජුට ජය සිරි දෙන සේක. තමන් අතින් අබිසෙස් ලත්
දාවිත් රජුට ද ඔහුගේ වංශයට ද සදහට ම කරුණා කරන සේක.

**දෙවන දේව ප්‍රකාශනය** 1 තෙසලෝනික 1:5-10

ශුද්ධ වූ පාවුලු තුමන් විසින් තෙසලෝනිකවරුන්ට ලියන ලද පළමුවන හසුනෙන් ගත් කොටසකි.

**"දේවතා වන්දනාවෙන් හැරී දේව පුත්‍රයාණන් වඩිනු බලාපොරොත්තු වන්න."**

මන්ද, අප සුබ අස්න ඔබ වෙත ගෙනාවේ වචන මාත්‍රයෙන් පමණක් නොව, ශුද්ධාත්ම බලය හා සහතික විශ්වාසය ඇතිව ය. ඔබගේ යහපත උදෙසා අපි ඔබ අතර කෙසේ ජීවත් වීමු දැයි ඔබ දන්නහු ය. ඔබ ද, බොහෝ දුක් විඳිමින්, ශුද්ධාත්මයාණන්ගෙන් වන ප්‍රීතිය ඇතිව පණිවුඩය පිළිගැනීමෙන්, අප ද සමිඳාණන් වහන්සේ ද අනුගමනය කරන්නෝ වූවහු ය. මෙලෙස ඔබ මසිදෝනියෙහි සහ ග්‍රීසියෙහි සිටින සියලු සැදැහැවතුන්ට ආදර්ශයක් වූවහු ය. මන්ද, ඔබ වෙතින් සමිඳාණන් වහන්සේගේ පණිවුඩයේ රාවය මසිදෝනියෙහිත් ග්‍රීසියෙහිත් පිළිරැව් දුන්නා පමණක් නොව, දෙවියන් වහන්සේ කෙරෙහි වූ ඔබේ ඇදහිල්ල සෑම තැන ම පතළ විය. මේ ගැන වැඩි යමක් කීම අවශ්‍ය නැත. අප ඔබ වෙත පැමිණි විට ඔබ අප පිළිගත් ආකාරය ගැන ද, ජීවමාන වූ සත්‍ය වූ දෙවියන් වහන්සේට සේවය කරනු පිණිස ඔබ දේවතා වන්දනාවෙන් දෙවියන් වහන්සේ වෙතට හැරුණු අන්දම ගැන ද ඔව්හු ම කතා කරති. තවද, මරණයෙන් උත්ථාන කරනු ලැබූ, පැමිණෙන්නට යන උදහසින් අප මුදන්නා වූ, තමන් වහන්සේගේ පුත්‍රයාණන් වූ ජේසුස් වහන්සේ ස්වර්ගයෙන් වඩිනු බලාපොරොත්තුවෙමින් ඔබ සිටින ආකාරය ගැන ද ඔව්හු කතා කරති.

දේව වාක්‍යය එසේය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

**සුපුවත් ජය නද** ක්‍රියා 16:14

ආලේලූයා ! ආලේලූයා
අහෝ සමිඳුනි, ඔබ පුතණුවන්ගේ වචන පිළිගැනීමට
අප සිත් පැහැදුව මැනව.
ආලේලූයා !

**ශුද්ධවූ සුවිශේෂය** මතෙව් 22:34-40

සුවිශේෂක මතෙව් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

**නුඹේ දෙවියන් වහන්සේට ප්‍රේම කරන්න.**
**නුඹේ අසල්වැසියාටත් ප්‍රේම කරන්න.**

ජේසුස් වහන්සේ සද්දුසිවරුන් නිරුත්තර කළ බව අසා පරිසිවරු එක්රැස් වූහ. ඔවුන් අතරෙන් විනයධරයෙක් උන්වහන්සේ පරීක්ෂා කරමින්, "ගුරුදේවයිනි, ව්‍යවස්ථාවලියෙහි ශ්‍රේෂ්ඨතම ආඥාව කිමෙක් දැ'යි ඇසී ය. උන්වහන්සේ ඔහුට කතා කොට, "නුඹේ මුළු හෘදයෙන්ද නුඹේ මුළු සිතින් ද නුඹේ මුළු බුද්ධියෙන් ද නුඹේ දෙවි ස්වාමීන් වහන්සේට ප්‍රේම කරන්න." මෙය ශ්‍රේෂ්ඨතම පළමු වන ආඥාව ය. දෙවන ආඥාව ද එයට සමාන ය. එනම්, "නුඹ, නුඹට ප්‍රේම කරන්නාක් මෙන් නුඹේ අසල්වැසියාටත් ප්‍රේම කරන්න" යනුයි. මුළු ව්‍යවස්ථාවලිය හා දිව්‍යසාවලිය රඳා ඇත්තේ මේ ආඥා දෙක මතය'යි වදාළ සේක.

සමිඳුණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය. ක්‍රිස්තුනි ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.

ලබන ඉරුදින දේව ප්‍රකාශන සඳහා http://sinhalagospel.lk/ වෙත පිවිසෙන්න.